## ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය - 2015

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, සංචිත වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1996 අංක 17 දරන ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩල පනතේ 24(3) වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

### 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හා සංචිත වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේ දැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය ව්‍යාචනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

2004 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාලව එකතුව රු.4,059,413 ක් හඳුනා නොගත් තැන්පතු මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ ගිණුම් ගත කිරීම වෙනුවට බැංකු සැසඳුම් ප්‍රකාශනයේ හඳුනානොගත් ශේෂ ලෙස දක්වා තිබුණි.

## 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම්

යෝජනා ක්‍රමයේ අරමුදල්වලින් ගෙවීම් කරන ලද රු. 213,923,543 ක්වූ ප්‍රතිලාභවලට අදාල පුද්ගලයින්ගේ නම්, ලිපිනයන්, ගෙවූ මුදල්, ගෙවූ දින, චෙක්පත් අංක ආදි විස්තර ඇතුළත් ලේඛන විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

## 2.3 නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 1996 අංක 17 දරන ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩල පනත | |
| (අ) 5 (ඉ) වගන්තිය | ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් සඳහා විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් වූ නියමිත ජීවන ගණක වාර්තා, මූල්‍ය හා මෙහෙයුම් වාර්තා පවත්වාගෙන යායුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 15 (1) වගන්තිය | දායක මුදල් ගෙවීමේදී අනුක්‍රමික වාරික 10 ක් ගෙවීම පැහැර හරින යම් දායකයෙකුට ප්‍රතිලාභ අහිමි වන බව පනතේ දක්වා තිබුණද ඊට පටහැනිව, දායක මුදල් ගෙවීම් ප්‍රමාද වීමේදී අයකරන දඩය, වාරික 10 කට සමාන වූ විට එම දායකයින් අක්‍රිය කර තිබුණි. |
| (ඇ) 15 (2) වගන්තිය | ප්‍රතිලාභීන් වෙත නිකුත් කරන ලද ඔප්පුව යටතේ ප්‍රතිලාභ අහිමි වී ඇති විට ඒ බව මණ්ඩලය විසින් එම දායකයාට දැන්විය යුතුය. කෙසේ වෙතත් අක්‍රිය වී ඇති දායකයින් හඳුනාගැනීමට නොහැකිවී තිබුණු බැවින් ඔවුන් වෙත 2015 දෙසැම්බර් 31 දින වන විටත් ඒ පිළිබඳ දැනුම් දී නොතිබුණි. |

# 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම්වලින් රු. 1,596,828 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.876,124 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,472,952 ක පිරිහීමක් දක්නට ලැබුණි. ආදායම රු.20,545,345 කින් වැඩි වුවද වියදම රු.23,018,297 කින් වැඩිවීම ඉහත පිරිහීමට හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලය රු.15,297,054 ක්වූ ඌනතාවය 2012 වර්ෂයේදී රු.18,535,954 දක්වා වැඩිවී තිබුණද 2013, 2014 වර්ෂවලදී මූල්‍ය අතිරික්තයක් වී තිබුණි. එහෙත් නැවතත් 2015 වර්ෂයේදී රු.1,596,828 ක ඌනතාවයක් බවට පත්වී තිබුණි. එසේ වුවද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා

වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේදී රු.32,463,160 ක්වූ ආයතනයේ දායකත්වය ක්‍රමයෙන් වර්ධනය වී 2014 වර්ෂයේදී සුළු වශයෙන් අඩු වී තිබුණද 2015 වර්ෂයේදී එය රු.90,874,614 දක්වා වැඩි වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කාර්යසාධනය

----------------

1996 අංක 17 දරන ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩල පනතේ 4 වන වගන්තියට අනුව ධීවර හා කෘෂිකාර්මික නොවන අංශවල ස්වයංරැකියාවල නියුතු තැනැත්තන් සඳහා විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ ඒ යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම මණ්ඩලයේ අපේක්ෂිත ප්‍රධාන කර්තව්‍ය විය.

2015 වර්ෂයට අදාල මණ්ඩලයේ කාර්යසාධනය පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් විශ්‍රාම වැටුප් ක්‍රමයන් සඳහා බඳවා ගෙන ඇති සම්පූර්ණ දායකයින් සංඛ්‍යාව 494,294 ක් වුවත් ඉන් අක්‍රීය තත්ත්වයේ පැවති දායකයන් සංඛ්‍යාව හඳුනා ගැනීමට නොහැකිවී තිබුණි. කෙසේ වුවද වාර්ෂිකව අක්‍රීයවීම් ඉහලයෑමේ ප්‍රවණතාවයක් පැවතියද එම යෝජනා ක්‍රමය තුල දායකයින් රඳවාගැනීම කෙරෙහි මණ්ඩලයේ අවධානය යොමුවී නොතිබුණි.

(ආ) පසුගිය වර්ෂ කිහිපයක තොරතුරු විශ්ලේෂණයේ දී විශ්‍රාම වැටුප් අරමුදල වෙත දායක මුදල් ලැබීම්වල පහල යාමක් හා විශ්‍රාම වැටුප් ගෙවීම් ඉහල යාමක් නිරීක්ෂණය විය. 2015 වර්ෂය තුළ මුළු දායක මුදල් ලැබීම් රු.156,235,114 ක් වූ අතර දායකයින් සඳහා මුළු ගෙවීම් රු.213,923,543 ක් වුයෙන් එය ලැබීම් වලින් සියයට 109 ක ප්‍රතිශතයක් විය.

(ඇ) දායකත්වය අහෝසි කර සාමාජික මුදල් ආපසු ගෙවීම්, ඉකුත් වර්ෂයේදී රු. 15,222,020 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී රු.24,444,852 ක් දක්වා වැඩි වී තිබුණි. ඒ අනුව දායකයින් විශාල වශයෙන් සාමාජිකත්වය අහෝසිකර මුදල් ආපසු ලබා ගැනීමේ ප්‍රවනතාවයක් පවතින බව නිරීක්ෂණය විය. දායක මුදල් හිඟහිට ඇති බැව් දායකයාට දැනුම් නොදීම නිසා මෙම තත්ත්වය ඉහළයෑමට හේතුවී තිබුණි.

(ඈ) 2015 දෙසැම්බර් 31 දින වන විට විශ්‍රාම වැටුප් අරමුදල් ගිණුම්වල පැවති ශේෂය රු.1,954,752,432 ක් වූ විට එදිනට මණ්ඩලය සතුව පැවති මුළු ආයෝජන වටිනාකම රු.1,821,504,103 ක් විය. විශ්‍රාම වැටුප් අරමුදල සඳහා අනාගතයේදී විශ්‍රාම වැටුප් බැදීම් සඳහා ප්‍රමාණවත් අරමුදල් මණ්ඩලය සතුව නොතිබීමේ අවධානමක් නොපවතීය යන්න විගණනයේදී බැහැරකළ නොහැකි විය. එකතුවන දායක මුදලින් දායක මුදල් ආපසු ගෙවීම්වලට අමතරව පසුගිය වර්ෂවල වෙනත් වියදම් දැරීම නිසා දායක අරමුදලට වඩා ආයෝජනය කරන ලද අරමුදල අඩුවී තිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් ඉකුත් වර්ෂයේ විශ්‍රාමික අරමුදල වෙනුවෙන් සකස්කළ ජීවන ගණක තක්සේරු වාර්තාව සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් මාසයේදී ලැබී තිබුණි. එම වාර්තාවට අනුව මණ්ඩලයේ ප්‍රතිලාභ ගෙවීමේ වගකීම රු.බිලියන 6.629 ක් විය. කෙසේ නමුදු වර්තමානයේ අරමුදලේ ආයෝජන වටිනාකම රු.බිලියන 1.861 ක් වුයෙන් පරතරය රු.බිලියන 4.768 ක් බව එම වාර්තාවෙන් දන්වා තිබුණි. 2015 දෙසැම්බර් 30 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒ සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගැනිමට තිරණය කර තිබුණද 2016 අගෝස්තු 31 දිනය වනවිටත් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවරයන් ගෙන නොතිබුණි.

(ආ) මණ්ඩලය විසින් විශ්‍රාම වැටුප් අරමුදලින් රු. 23,947,068 ක් වැය කර නව පරිගණක පද්ධතියක් ස්ථාපිත කර තිබුණද, එය පවත්වාගෙන යාමේදී පහත අඩුපාඩු හා දුෂ්කරතා මතුවී තිබුණි.

(i) අක්‍රීය හා සක්‍රීය දායකයන් පිළිබඳ තොරතුරු ලබා ගැනීමට නොහැකිවීම සහ විශ්‍රාම මොඩියුලය හරහා අවුරුදු 60 සම්පූර්ණවූ දායකයන් හඳුනාගැනීමට නොහැකි වීම.

(ii) පැරණි හා නව පරිගණක පද්ධති දෙකක් ක්‍රියාත්මකවීම නිසා වාර්තා ගැනීමේ ගැටළු ඇතිවීම.

(iii) "ආරස්සාව" පූර්ව සැලසුමේ දායකත්ව අයදුම්පත් පරිගනක ගත කිරීමට හා විශ්‍රාම වැටුප් ගෙවීමට සහ දිරි දීමනා ගෙවීමට අදාල දත්ත සැකසිමට නොහැකි වීම.

(iv) සියළු බඳවා ගැනීම් නව පරිගනක පද්ධතියට අදාල කිරීම කරනු ලැබුවද, 2013 වර්ෂයෙන් පසු විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා පැරණි පරිගණක පද්ධතිය භාවිතා කරනු ලැබීම හේතුවෙන් නව පරිගණක පද්ධතියට ඇතුලත් කර ඇති දායකයන්ට විශ්‍රාම වැටුප් ගෙවිය යුතු අවස්ථාව වන විට නව පරිගණක පද්ධතියෙන් අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට නොහැකිවීම.

(v) යම් දායක අංකයකට අදාලව වාරිකයක් පරිගණකගත කිරීමේදී එකම රිසිට්පත එකවිට එක් දායකයකු හෝ දායකයන් කිහිපදෙනෙකුට පරිගණක ගත කළ හැකි වීම නිසා විශේෂයෙන් බැංකු මගින් වාරික ගෙවීම් කරන දායකයන්ට සත්‍ය වශයෙන් වාරික ගෙවීමකින් තොරව විශ්‍රාම වැටුප් ලැබීමේ සහ දායකත්වයෙන් ඉවත්වීමේදී නොගෙවූ මුදලක් ආපසු ලබාගත හැකි වීමේ ඉහල අවධානමක් තිබීම.

(vi) අයදුම්පත් පරිගණක ගත කිරීමේදී පවතින ක්‍රමය අනුව හැඳුනුම්පත් අංකයන් 9 ක් පමණක් සටහන් කළ හැකි වුවත්, වර්තමානයේදී නව හැඳුනුම්පත අනුව අංකයන් 12 ක් සටහන් කළ යුතු බැවින් එම පහසුකම මෙම පරිගණක පද්ධතියට ඇතුළත් කර ගැනීමට නොහැකිවීම.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ ගිණුම්වල පාරිතෝෂික ගෙවීම සඳහා රු.16,114,794 ක් ප්‍රතිපාදනය කර තිබුණි. කෙසේ නමුත්, අනාගත පාරිතෝෂික ගෙවීම් අවස්ථාවලදී ඒ සඳහා යොදාගැනීමට හැකිවන පරිදි ඊට සමාන මුදලක් ආයෝජනය කර නොතිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

අවශ්‍ය අරමුදල් වෙන්කර ගැනීමකින් තොරව සහ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව, රජයේ තක්සේරුව වූ රු.මිලියන 165 ඉක්මවා මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යාමට විශ්‍රාම වැටුප් අරමුදලින් රු.මිලියන 195 ක් ගෙවා ගොඩනැගිල්ලක් මිලදීගෙන තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 සංයුක්ත සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මණ්ඩලය විසින් සංයුක්ත සැලැස්මක් සකස් කර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 5.2 ක්‍රියාකාරී සැලැස්ම

මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ භෞතික ඉලක්කයන් දක්වා නොතිබීම නිසා සපුරාගෙන තිබුණු මූල්‍ය ඉලක්කයන් වලට ගැලපෙන පරිදි භෞතිකව තථ්‍ය මට්ටම් කරා ළඟාවී තිබේදැයි පරීක්ෂා කිරීමට නොහැකි විණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් මණ්ඩලයේ සභාපති වෙත වරින්වර යොමු කරන ලදී. දායක මුදල් රැස්කිරීමට අදාල පාලන ක්ෂේත්‍රයෙහි පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) දායක මුදල් ප්‍රධාන කාර්යාලය වෙත ප්‍රේෂණය කිරීම හා ගිණුම්ගත කිරීමේ ප්‍රමාදයන් පැවතීම.

(ආ) බැංකු මගින් රැස් කරන වාරික සටහන් කිරීමේදී දායකයා හඳුනා ගැනීමේ නිශ්චිත ක්‍රමවේදයක් නොමැතිවීම.

(ඇ) අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිගනක පද්ධතියක් නොමැතිවීම.